## ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

## කොළඹ

---

# පුවත්පත් නිවේදනය

## වතුකරයේ ක්‍රියාත්මක ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ ඉදිකළ නිවාස ජනතා අයිතියට පත්කිරීම සහ තවත් නිවාස 10,000ක් ඉදිකිරීම සඳහා ගිවිසුම් අත්සන් කිරීම

2018 අගෝස්තු මස 12 වන දින නුවරඑළිය දිස්ත්‍රික්කයේ පූඩළුඔය, ඩන්සිනන් වතුයායේ පැවති විශේෂ උත්සවයකදී, වතුකරයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ ඉදිකළ නිවාස ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කෙරිණ. ගරු ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා මෙම අවස්ථාව සඳහා විශේෂ පණිවිඩයක් යොමු කර තිබිණ.

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු පලනි දිගම්බරම් මැතිතුමා, වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මැතිතුමා සහ ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා විසින් නව නිවාස සහ ඉඩම් ඔප්පු ප්‍රතිලාභීන් වෙත පිරිනමන ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, මධ්‍යම පළාත් සභා සාමාජිකයින් සහ රජයේ නිලධාරින් මෙන්ම වැවිලි මානව සංවර්ධන භාරයේ නිලධාරින්, ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ ප්‍රතිලාභීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ඇතුළු ඩන්සිනන් වතුයායේ 1,500කට ආසන්න පිරිසක් මෙම අවස්ථාවට සහභාගී විය.

සිය විශේෂ පණිවිඩය මගින් අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා අලුතෙන් ඉදිකරන ලද තනි නිවාසවල අභිමානවත් හිමිකරුවන්ට සුබපැතුම්

පිරිනැමීය. මෙම නිවාස ව්‍යාපෘතිය  නිවාස හිමිකරුවන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය සහිතව සුවිශේෂී අයුරකින් ක්‍රියාත්මක කළ බව පෙන්වා දුන් එතුමා ඇමරිකානු ඩොලර් මිලියන 350කට වැඩි ප්‍රදානයක් යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ඉන්දීය නිවාස ව්‍යාපෘතිය ඉන්දීය අධාර යටතේ විදේශ රටක ක්‍රියාත්මක කර ඇති විශාලතම ව්‍යාපෘතිය බව ප්‍රකාශ කළේය. ඉන්දියාව පොරොන්දු වී ඇති නිවාස 60,000න් මේ වන විට නිවාස 47,000කට ආසන්න ප්‍රමාණයක් ඉදිකර ඇති බවද එතුමා සිහිපත් කළේය.

එසේම පසුගිය මාසයේදී ශ්‍රී ලංකාව පුරා දියත් කරන ලද පූර්ව රෝහල් හදිසි ගිලන්රථ සේවය, 2017 අගෝස්තු මාසයේදී කොළඹ සිට වරණාසි දක්වා ආරම්භ කරන ලද එයා ඉන්ඩියා ගුවන් ගමන්, වතුකරයේ නිවාස 10,000ක් ඉදිකිරීම සඳහා අද දින (2018, අගෝස්තු 12) අත්සන් තබන ලද ගිවිසුම යනාදිය සිහිපත් කළ අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා පසුගිය වසරේ සිය ශ්‍රී ලංකා සංචාරය අතරතුර ලබාදුන් පොරොන්දු ඉටුකිරීමට හැකිවීම පිළිබඳව සිය සතුට ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාව සැමවිටම ඉන්දියාවට සුවිශේෂී වූ බව සහ ඉදිරියටත් එසේම සුවිශේෂී වන බව පැවසූ එතුමා ඉන්දීය රජය සහ ජනතාව සාමය සහ සෞභාග්‍යය කරා පියනගන ශ්‍රී ලාංකේය ජනතාව සමඟ නිබඳව සිටින බව අවධාරණය කළේය.

උත්සවය ඇමතූ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා වතුකරයේ නිවාස ඉදිකිරීම ඇතුළු සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ඉන්දියාව ශ්‍රී ලංකාවට දක්වන සහයෝගය අගය කළේය.

මෙම අවස්ථාවේදී  වතුකරයේ තවත් නිවාස 10,000ක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා සහ කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු පලනි දිගම්බරම් මැතිතුමා විසින් අත්සන් තබන ලදී. ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2017 වසරේ ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී මෙම අමතර නිවාස 10,000 ඉදිකර දීමට පොරොන්දු විය. මෙම ගිවිසුමත් සමඟ වතුකර ජනතාව වෙනුවෙන් ඉන්දියාව විසින් ඉදිකරන නිවාස සංඛ්‍යාව 14,000 දක්වා වැඩි වී ඇත.

***

2018 අගෝස්තු 12

කොළඹ